**ශීර්ෂය 165 - ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත්කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ත්‍රෛයිභාෂාවෙන් සකස් කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉංග්‍රීසි,සිංහල හා දෙමළ භාෂාවෙන් යුත් මූල්‍ය ප්‍රකාශන පිළිවෙලින් දින 12 ක් දින 15 ක් හා දින 84 ක් ප්‍රමාදවීමෙන් පසු විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 9.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවීම. | අවසන් ගිණුම් සැකසීමේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීම හා දෙමළ භාෂා පිටපත පරිවර්තන ගැටළු හේතුවෙන් ප්‍රමාද වී තිබීම. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ආදායම් නොවන ලැබීම් යටතේ තැන්පතු ආදායම රු.6,260,832 ක් ලෙස දක්වා තිබුණද, වෙනත් ලැබීම් යටතේද තැන්පතු ආදායම රු.6,209,570 ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | රු. 6,209,570 ක මුදල අතපසු වීමකින් වැඩිපුර ගිණුම්ගත වී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව වත්කම් අත්පත්කර ගැනීම් රු.43,470,851 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එය රු.43,000,000 ක් වීම හේතුවෙන් රු.470,851 වෙනසක් නිරීක්ෂණය විය. ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | මූල්‍ය නොවන වත්කම්වල අගයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතු වීම. | එකඟ වෙමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් අයකර ගැනීම් රු.7,014,545 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ එය රු.229,470 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.6,785,075 ක අත්තිකාරම් ලැබීම් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල මුළු අත්තිකාරම් අයකර ගැනීම්, මූල්‍ය කාර්යසාධනයට ඇතුලත් කළ යුතු වීම. | හරස් සටහන් මගින් සිදුකරන ලද අත්තිකාරම් පියවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර නොමැත. |
| (iv) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.3,028,162 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.3,648,146 ක් ලෙස සටහන් වීමෙන් රු.619,984 ක වෙනසක් නිරීක්ෂණය විය. | වර්ෂයට අදාල මුළු අත්තිකාරම් ගෙවීම් මූල්‍ය කාර්යසාධනයට ඇතුළත් කළ යුතු වීම. | මුදලින් ලබා දුන් අත්තිකාරම් පමණක් මූල්‍ය කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර තිබේ. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාල මූලධන වියදම රු.393,376,805 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වටිනාකම රු.408,307,856 ක් වුයෙන් රු.14,931,051 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් හඳුනාගැනීම කළ යුතු වීම. | විගණනයේදී පෙන්වාදීම් අනුව නිවැරදි කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | අත්තිකාරම් ගිණුම් කටයුත්ත වෙනුවෙන් වූ මුදලින් ලැබීම් හා ගෙවීම් සියල්ලම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වීම. | විගණනයේදී පෙන්වාදීම් අනුව නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන වාර්තාව එවා ඇත. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **-----------------------** | **-----------** | **---------------------** |
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,655,233 ක් වූ කාර්යාල උපකරණ හා රු.12,670,780 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ නිවාස නොවන ගොඩනැඟිලි යටතේ එකතුවක් ලෙස දක්වා තිබුණි. | වත්කම් පන්තිය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකල යුතු වීම. | එකඟ වෙමි. |
| (ii) වටිනාකම රු.43,000,000 ක වාහන මිලදී ගැනීම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ කාර්යාල ගොඩනැඟිලි වශයෙන් දක්වා තිබුණි. | වත්කම් පන්තිය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකල යුතු වීම. | එකඟ වෙමි. |
| (iii) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.63,796,863 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අගය බිංදුව ලෙස වාර්තා කර තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන්හි වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබීම හා ගිණුම පිළියෙල කරන ලද නිලධාරීන් ස්ථානමාරු වී ගොස් ඇත. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-----------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | -------------------- |
| (i) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය<br>-----------------------------------------------------<br>2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. | එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය<br>-----------------------------------------------------<br>මුදල් රෙගුලාසි 451 ප්‍රකාර චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 දරන පෝර්මය පරිදි ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් සටහන් කර ගැනිමට හැකිවන පරිදි ලේඛනයක් පවත්වා ගත යුතුය. | -එම- |
| (iii) ඇප ලේඛනය<br>---------------<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | -එම- |

(iv) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454 (2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | -එම- |

(v) හානි පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | -එම- |

(vi) බැරකම් පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | -එම- |

(vii) ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647 (ඇ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොතක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඇ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොතක් පවත්වා ගත යුතුය. | -එම- |

(viii) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය. | -එම- |

**(ඉ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එකඟ වෙමි. පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | -එම- | -එම- |

**(ඊ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | රු. | | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | 644,920 | රෙගුලාසිය ප්‍රකාරව අලාභ | | |

| | | | |
|---|---|---|---|
| ---------------------- මුදල් රෙගුලාසි 104(4) | හානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් වාහන 2 ක් සම්බන්ධයෙන් අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. මේ වන විට පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සලසා තිබූ ප්‍රතිපාදන නිෂ්ඵල වීම** | | |
| පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු.62,000 ක් හා මූලධන වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1517.76 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | ගැසට් නිවේදන මගින් අමාත්‍යාංශයේ විෂයපථය වෙනස් වන විට අදාල වැය විෂය සඳහා වන ප්‍රතිපාදන ආපසු යැවීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය තුලදී අවස්ථා කිහිපයකදීම එම අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වීම හේතුවෙන් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම. |
| **(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම** | | |
| **(i)** පුනරාවර්තන වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 670.17 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 40.13 ක් පමණක් උපයෝජනය කිරීම නිසා මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 630.04 ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14ක සිට සියයට 96 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම-. | -එම- |

| | | |
|---|---|---|
| **(ii)** මූලධන වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 5,025.75 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 2,510.36 පමණක් උපයෝජනය කිරීම නිසා මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,515.39 ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 36 ක සිට සියයට 99ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහාම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. | එකඟ වෙමි. මේ වන විට පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15.3 (ඉ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත පරිදි ඒ ඒ වර්ෂයන්ට අදාල කාර්යසාධන වාර්තාවන් පිළියෙල කළ යුතු වීම. | එකඟ වෙමි. මේ වන විට පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දේශීය අරමුදලින් මිලදී ගෙන තිබූ රු.24,876,534 ක් වූ දේපල පිරියත හා උපකරණවල විස්තර ඇතුලත් වාර්තාවක් 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. | ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය සතු ස්ථාවර වත්කම්ද කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කළ යුතු වීම. | එකඟ වෙමි. මේ වන විට පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. |

## 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක DMA /2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතු වීම. | පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇති බව හා අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී තිබූ බවට තොරතුරු සොයා ගත නොහැකි බව. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශයක් විසින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එක් විගණන හා කළමනාකරණ කමිටුවක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි සෑම වර්ෂයකම අදාල කමිටු රැස්වීම් පැවැත්විය යුතු වීම. | එකඟ වෙමි. මේ වන විට පෙර පැවති ජාතික සමගිය හා සහජීවන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. |